මගේ අංකය : 4/ගුරුආ/5/309/22
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය',
ශ්‍රී ජයවර්ධනපුර, බත්තරමුල්ල.
1993.01.26

ලේ. අංක. 1993/01
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත.

## වැඩිහිටි අධ්‍යාපන නිලධාරීන්

ඉහත කරුණු සම්බන්ධයෙන් මා විසින් ඔබ වෙත එවන ලද මගේ සමාංක හා 90.11.05 දිනැති චක්‍රලේඛයට අමතර වශයෙනි.

02. 1989 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 106 (34 වන අවිච්ඡේදය) වූ "කාර්යයෙහි නියුක්ත මණ්ඩලීය අධ්‍යාපන නිලධාරීන් හා වැඩිහිටි අධ්‍යාපන නිලධාරීන්" පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධව 1990 පෙබරවාරි මස 21 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය පිළිබඳ ඔබගේ අවධානය යොමු කරවමි.

03. එම අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ V වැනි පන්තියේ තනතුරු ලැබ 1985.01.01 දින සිට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියට අන්තර්ග්‍රහණය කර ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ට වැඩිහිටි අධ්‍යාපන නිලධාරීන්ගේ රාජකාරි අනිවාර්යයෙන්ම පැවරිය යුතු අතර, ඊට අමතරව වෙනත් රාජකාරි ද පැවරීම පිළිබඳ විරුද්ධත්වයක් නොමැති බව දන්වමි.

ආර්. අයි. ටී. අලස්
අධ්‍යාපන රාජ්‍ය ලේකම්
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම් වෙනුවට

එස්. 18.